රුහුණ විශ්වවිද්‍යාලය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - 2016 / 2017

පළමු සමාසික අවසාන පරීක්ෂණය - 2017 සැප්තැම්බර්

**MAE 5103 - ශ්‍රී ලංකාවේ ආර්ථිකය**

කාලය : පැය 03 යි.

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

## පළමු කොටස

01.

i. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ මෑකතාලීන උපනතීන් පරීක්ෂා කරන්න.

(ලකුණු 04)

ii. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාව තුළ හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණ කවරේද?

(ලකුණු 04)

iii. ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආර්ථික වර්ධනය, දරිද්‍රතා හිතෛෂී ආර්ථික වර්ධනයක් ලෙස හඳුනා ගන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 03)

iv. ශ්‍රී ලංකාවේ දුප්පත්කම පහළ දැමීම අරභයා රජය අනුගමනය කළ විකල්ප වැඩ සටහන් පිළිබඳ විමසුමක යෙදෙන්න.

(ලකුණු 04)

02.

i. 'ආර්ථික ගෝලීයකරණය'යන්න නිර්වචනය කොට එහි ගාමක බලවේග පෙන්වා දෙන්න.

(ලකුණු 06)

ii. ශ්‍රී ලංකාව ඇතුලු සංවර්ධනය වෙමින් පවතිනරටවල ගෝලීයකරණ අත්දැකීම් සංවර්ධිත නැගෙනහිර ආසියාතික රටවල ආර්ථිකය සමඟ සසඳන්න.

(ලකුණු 04)

iii. ගෝලීයකරණයේ වාසි අවාසි සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

03. පහත සඳහන් ඒවායින් ඕනෑම තුනක් (03) පිළිබඳ විස්තරාත්මක සටහන් ලියන්න.

i. තොරතුරු තාක්ෂණය සහ නව ආර්ථිකය

ii. ශ්‍රී ලංකාවේ මෑතකාලීන සංවර්ධනය ක්‍රියාවලිය තුළ ජාත්‍යන්තර සහභාගිත්වය

iii. සංවර්ධනය වන රටවල නිෂ්පාදන ඵලදායිතාව ප්‍රවර්ධනෙහි ලා බලපාන සාධක

iv. ශ්‍රී ලංකාවේ ඉදිරි ආර්ථික අභියෝග

(ලකුණු 15)

## දෙවන කොටස

04.

i. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ කාර්යභාරය විග්‍රහ කරන්න.

(ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ ආහාර භෝග වගාවන්ගේ පිරිවැය ඉහළ යාමට ඉවහල් වූ සැබෑ හේතූන් පෙන්වා දෙන්න.

(ලකුණු 05)

iii. ඉදිරි ආර්ථික සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ සහල් ආර්ථිකය දැඩි අභියෝගයක් ඉදිරිපත් කරාවිද? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

05.

i. සීඝ්‍ර ආර්ථික සංවර්ධනය තුළ යහපාලනයේ කාර්යභාරය විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ දිගු කාලීන ආර්ථික වෘද්ධියට යහපාලන මූලධර්ම වැදගත් වන්නේ කෙසේද?

(ලකුණු 05)

iii. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය තුළ දේශපාලන ස්ථායිතාවය පූර්ව කොන්දේසියක් වශයෙන් සලකන්නේද?

(ලකුණු 05)

06.

| වර්ෂය | ළමා යැපුම් අනුපාතය | වැඩිහිටි යැපුම් අනුපාතය |
|---|---|---|
| 1881 | 81.8 | 5.8 |
| 1946 | 64.9 | 9.6 |
| 1991 | 51.4 | 13.3 |
| 2021 | 34.1 | 27.5 |

i. ඉහත සංඛ්‍යා උපයෝගි කර ගනිමින් ශ්‍රී ලංකාවේ ජනගහනයේ වයස් ව්‍යුහයෙහි සිදුවෙමින් පවත්නා වෙනස්කම් හි ස්වභාවය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ ජනගහනයේ වැඩිහිටි ජනගහනයේ සිදුවන වෙනස්කම් මගින් ඇති කරනු ලබන ආර්ථික හා සමාජ ප්‍රතිවිපාක පෙන්වා දෙන්න.

(ලකුණු 05)

iii. ශ්‍රී ලංකාවේ ශ්‍රම ඵලදායිතාවයේ වැඩි දියුණුව සඳහා දායකත්වයක් සැපයීමට ශ්‍රම වෙළෙඳපොල අපොහොසත් වීමට බලපෑ ඇති හේතූන් දක්වන්න.

(ලකුණු 05)

@@@@@@@@